

## ජෝන් බ්‍රම්බි දිනුම් කණුවට ගෙන ගිය අපේ ක්‍රීඩකයා.

# දුලිප් ලියනගේ

මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

90 දශකයේ එක් වකවානුවක කොළඹ පහේ උද්‍යාන පාරේ ඇවිදමින් එවකට මා සේවය කළ ඇඩික් ආයතනයට යමින් සිටියදී ඒ අසළ පිහිටි කෝල්ට්ස් ක්‍රීඩා පිටියේ ක්‍රිකට් පුහුණු වෙමින් සිටි ක්‍රීඩකයින් දිනපතා මගේ ඇස ගැටෙයි. ඔවුන් අතරින් එක්තරා සුවිශේෂී ක්‍රීඩකයකු මගේ දැඩි අවධානය දිනා ගත්තේ ඔහුගේ උස මහත දේහයත් ඔහු සතුව තිබූ පන්දු යැවීමේ ඉරියව්වත් නිසා ය. ඔහු මට සිහිපත් කළේ බටහිර ඉන්දීය ක්‍රීඩක ජොවෙල් ගානර් ය.

එයින් කළකට පසු තුන් ඉරියව්වන්ම දස්කම් පෑ මේ ක්‍රීඩකයා ශ්‍රී ලංකා පිලට පන්දු යවන්නකු ලෙස ඇතුලත් වූ අතර ශ්‍රී ලංකා කණ්ඩායමේ නිත්‍ය ක්‍රීඩකයකු බවට පත් විය.

නිරහංකාර මිත්‍රශීලී මේ ක්‍රීඩකයා පිළිබඳව





ඔස්ට්‍රේලියානු පුවත්පතක සඳහනක් කර තිබෙනු පසුගිය දිනෙක මම දුටුවෙමි. ඔහු සොයා ගොස් ඔහු පිළිබඳ මතකය අලුත් කැන්නට මා පෙළඹවනු ලැබුවේ ඒ ලිපිය විසිනි.

මේ ක්‍රීඩකයා වේග පන්දුවෙන් ශ්‍රී ලංකා පිළ ශක්තිමත් කළ දුලිප් ලියනගේ ය.

**දුලිප්.. ඔබ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩා වරම ලැබුවේ 1992 දී. ඒ ඔස්ට්‍රේලියානු කණ්ඩායමට එරෙහිව. එදා අපි දුටුවා ඔබ යැවූ පළමු පන්දු ඕවරයේ තුන්වන පන්දුවෙන් ඕස්ට්‍රෙලියානු පිතිකරු ටොම් මූඩි දවාගන්නා අන්දම.. මේ මතකයෙන් අපේ කතාව පටන් ගමු ද?**

ඒක මගේ ක්‍රීඩා දිවියේ කවදාවත් අමතක නොවන සිදුවීමක්. මම යැවූ තුන්වන පන්දුව කෙළින්ම කඩුල්ලේ දැවටී ටොම් මූඩි දැවී ගියා. මම වගේ නවක ක්‍රීඩකයකුට ඒ සිදුවීම විශාල ධෛර්යයක් ශක්තියක් ලබා දුන්නා..

**එදා ඔබ නව වාර්තාවක් පිහිටවූ බව ඔබ දන්නවා ද?**

ඔව්.. මම පසුව දැනගත්තා රිචඩ් හැඩ්ලිගෙන් පසු තමා යැවූ මංගල පන්දු වාරයේ තුන්වන පන්දුවෙන්ම කඩුල්ලක් දවාගත් ක්‍රීඩකයා බවට මම පත්වුණ බව.. ඒ වාර්තාව බොහෝ කාලයක් නොබිඳී තිබුණා.

**ඔබේ මංගල ටෙස්ට් තරගය පිළිබඳ තවත් වැදගත් මතකයක් තිබෙනවා නේද?**

ඔව්.. පසු කාලයක ජාත්‍යන්තර කීර්තියට පත්වුණ සහෝදර ක්‍රීඩක මුත්තයියා මුරලිදරන්ගේ පළමු වතාවට ටෙස්ට් පිටියට බැස්සේ ඒ තරගයෙන්මයි.

**ටෙස්ට් තරග සහ එක්දින තරග ගත්තාම ඔබේ වැඩි කැමැත්ත තිබෙන්නෙ මොන තරග වලටද?**

මම 2004 දී ජාත්‍යන්තර තරග වලින් සමුගන්නා තෙක්ම ටෙස්ට් තරග වලටත් එක්දින තරග වලටත් එක ලෙස සහභාගි වෙලා තියෙනවා. ඒත් මගේ වැඩි කැමැත්ත තියෙන්නෙ ටෙස්ට් තරග වලටයි. ක්‍රිඩකයකුට තාක්ෂණික වශයෙන් නිවරදිව ක්‍රීඩා කළ හැකි වන්නේ ටෙස්ට් තරග වලදීයි. ඒ වගේම ක්‍රීඩකයකු තාක්ෂණික වශයෙන් පරිනත නැත්නම් ඔහුට ටෙස්ට් ක්‍රීඩකයකු වන්නට අවස්ථාවක් වත ලැබෙන්නෙ නැහැ. අහම්බෙන් හරි ලැබුණාත් ඒ ස්ථානය රැකගන්න ඔහුට හැකි වන්නේ නැහැ.

**මේ දිනවල ශ්‍රී ලංකා කණ්ඩායම සාජා ක්‍රීඩාංගනයේදී පකිස්ථානු කණ්ඩායම සමග ක්‍රීඩා කරනවා. මේ ක්‍රීඩාංගනය ඔබටත් විශේෂ එකක් නේද?**

ඔව්.. මම ටෙස්ට් පිටියෙන් සමුගත්තේ සාජා ක්‍රීඩාංගනයේදී පැවති තරගයකින් පසුවයි. ඒ 2004 දී සිම්බාබ්වේ කණ්ඩායමත් සමග පැවති තරගයෙන්. ඒ වන විට මම අර්ජුන රණතුංග අරවින්ද සිල්වා මාවන් අතපත්තු හා සනත් ජයසූරිය කියන ප්‍රවීණ නායකයන් යටතේ ක්‍රීඩා කර තිබුණා.

**ඔබ දැන් ඔස්ට්‍රේලියාවේ ක්‍රිකට් ක්‍රිඩාවට සම්බන්ධව සිටිනවා. ඒ අවස්ථාව උදා වුණේ කොහොමද?**

මම අවුරුදු 2 ක් එංගලන්තයේ ප්‍රාන්ත ක්‍රිකට් ක්‍රීඩා වල නිරතව සිටියා. එහිදි මගේ හැකියාවන් දැකපු ඔස්ට්‍රේලියාවේ ඊස්ට් අයිවන් හෝ ක්‍රිකට් සමාජය මට ආරාධනා කළා ඔස්ට්‍රේලියාවට පැමිණ ඔවුන් සමග එක්වන ලෙස. ඒ අනුව මම 2006 වසරේ දී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා. ඉන්පසු මම ක්‍රිකට් ක්‍රීඩකයකු හැටියට පමණක් නෙවෙයි ජූනියර් හෙඩ් කෝච් සහ සීනියර් ස්කිල් කෝච් ලෙසත් සේවය කළා. අවුරුදු තුනක් පිතිකරුවකු ලෙස ලණු ලබා ගැනීමේදී දෙවන ඉහළම සාමාන්‍යය බලා ගන්නත් මට පුලුවන් වුණා.

දැන් මම ප්‍රෙස්ටන් Druids කණ්ඩායමට ක්‍රිඩා කරමින් එහි ප්‍රධාන ස්කිල් කෝච් ලෙස සේවය කරනවා.

**කලින් අහන්න අමතක වුණ ප්‍රශ්නයක් තියෙනවා. මොකක්ද මේ ජෝන් බ්‍රම්බි දිනෙව්වයි කියන කතාව. ඔබ දේශපාලනයටත් සම්බන්ධ වුණා ද?**



(හිනා) නෑ නෑ.. ඒක මේ ක්‍රිකට් කතාවක්. අවුරුදු ගණනාවක් ජෝන් බ්‍රම්බිගෙ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු ක්‍රිකට් කණ්ඩායම පරාද වෙලා හිටියෙ. ජෝන් බ්‍රම්බි මට ආරාධනා කළා ඔහුගේ කණ්ඩායමට සම්බන්ධ වන ලෙස. අවසාන තරගයෙදි ජොන් බ්‍රම්මිත් මාත් අවසන් පිතිකරුවන් දෙදෙනා ලෙස පන්දුවට පහර දෙමින් හිටියා. ඒව න විට ලකුණු 76 ක් ලබාගෙන සිටි මම අවසන් පන්දුවට ලකුණු 6 ක් ගහලා ඩෝන් බ්‍රම්බිගේ කණ්ඩායමට ජයග්‍රහණය ලබා දුන්නා. ඔහු මා වැළඳගෙන කිව්වා -උඹ අවුරුදු 6 කට පසුව මගේ කණ්ඩායම දිනෙව්වා" කියලා. බොහෝ අය දන්නෙ නැහැ ජෝන් බ්‍රම්බි හොඳ ක්‍රිකට් ක්‍රීඩකයෙක් බව.

**ඔබ අලුතින් ක්‍රිකට් ක්‍රීඩා ඇකඩමියක් ආරම්භ කරන්නට යන බව අපට දැනගන්න ලැබුණා. ඒ ගැන කතා කරමුද?**

ඔව්. මම ක්‍රීඩා පුහුණු කරුවකු ලෙස එංගල්තයේ පාඨමාලාවක් හැදෑරුවා. ඒ වගේම එසෘජ ආයතනයේ ඩෙනිස් ලිලී යටතේ පන්දු යවන්නකු ලෙස පුහුණුව ලැබුවා. ඒ එක්කම ලංකාවේ කෝල්ට්ස් ක්‍රිකට් කණ්ඩායමේ පුහුණු කරු ලෙස කාලයක් සේවය කළා. ඔස්ට්‍රේලියාවේ පාසල් කීපයක සහ ක්‍රිකට් වික්ටෝරියා ආයතනයේ පුහුණුකරුවකු ලෙස සේවය කළා. මේ අතර වාරයේදී මගේ හිතවතුන් ඉල්ලා සිටියා මා ලද දැණුම අපේ අයටත් බෙදා දෙන්න යම්කිසි වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලෙස. ඒ අනුවයි මම මේ ඇකඩමිය ආරම්භ කරන්න තීරණය කළේ.

**අපි දන්නවා ඕස්ට්‍රෙලියාවේ ඉතා දක්ෂ පුහුණුකරුවන් ඉන්න බව. ඔවුන් ජාත්‍යන්තර වශයෙන් පවා පුහුණුකිරීම් කරනවා. ඒ අතරේ ඔබේ සම්ප්‍රාප්තිය වැදගත් වන්නෙ කොහොමද?**

ඒක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. තාක්ෂණයෙන් පරිපූර්ණ හොඳ පුහුණුකරුවන් ඔස්ට්‍රෙලියාවේ ඉන්නවා. නමුත් ගැටළුවකට තියෙන්නෙ ඔවුන් පුහුණුකිරීම් කරන්නෙ ප්‍රවීණත්වයට පත් වූ ක්‍රිඩකයන්ට වීමයි. පාසල් අවදියේ ක්‍රිඩාවට අවතීර්ණ වන දරුවන් නිසි ආකාරයට පුහුණුකිරීම

විසිවන පිටට


STEVE LIGHTFOOT
Sri Lankan star gives Banyule a pre-finals shock
Dulip Liyanage (above) cuts loose with the bat while Banyule fielders show their exhaustion and relief at the fall of a wicket (top right)